# මධුපිණ්ඩික සූත්‍රය

(ම.නි. I, බු.ජ.ත්‍රි. 272-286 පිට)

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයෙහි වැඩ වෙසෙන සමයෙහි දේශනා කළ මෙම සූත්‍රය සිතෙහි කෙලෙස් හට ගෙන සත්ත්වයා සසරට වැටෙන ආකාරයත් කෙලෙස්වලින් සිත මුදවා ගෙන සසරින් එතෙරවූ තැනැත්තාගේ ස්වභාවයත් විස්තර කරමින් දේශනා කරන ලද්දකි. බුදුරජාණන් වහන්සේගේ කෙටි අනුශාසනාවක් සහ ඊට අදාළව මහාකච්චාන මහරහතන් වහන්සේ විසින් සිදුකළ විස්තරකථනයක් මීට ඇතුළත් වේ.

දිනක් භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්නුවර නිග්‍රෝධාරාමයෙහි වැඩ වෙසෙන සමයක පෙරවරුවෙහි පිණ්ඩපාතය පිණිස හැසිර පස්වරුවෙහි සමීපයෙහි පිහිටි මහවනයට වැඩම කළහ. එහි බෙලිගසක් මුල දිවාවිහරණය කොට වැඩ වෙසෙන අවස්ථාවෙහි දණ්ඩපාණි නම් ක්ෂත්‍රිය රජතුමා ද එහි මෙහි සක්මන් කරන අතර එහි පැමිණියේ ය. මෙහි දී බුදුරදුන් මුණගැසුණු දණ්ඩපාණි බුදුරදුන් සමඟ සතුටු සාමීචි කථා කොට නිමවා අවසන උන්වහන්සේ වෙතින් පැනයක් විචාළේ ය. 'ශ්‍රමණයන් වහන්ස, ඔබ වහන්සේ කෙබඳු වාද/ දෘෂ්ටි ඇත්තෙක් ද ? කුමක් ප්‍රකාශ කරන්නේ ද ? (***කිංවාදී සමණො, කිමක්ඛායීති***)' යනුවෙනි. එවිට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කර සිටියේ 'ඇවැත්නි, දෙවියන් බඹුන් මරුන් සහිත ලෝකයෙහි දෙවියන් බඹුන් මරුන් අතරෙහි යමෙක් වාද නොකර සිටී ද, කාමයෙන් තොරව සැක දුරුකොට සියලු භවයන්හි තෘෂ්ණාව දුරුකොට ආශ්‍රාව රහිතව වෙසේ ද මම එබඳු වාද ඇත්තෙක්මි' යනුවෙනි. මෙසේ ප්‍රකාශ කළ කල්හි දණ්ඩපාණි හිස සලා නලලෙහි රැලි ගන්වා බුදුරදුන් වෙතින් නික්ම ගියේ ය.

බුදුරජාණන් වහන්සේ එම මහවනයෙන් නික්ම නැවත නිග්‍රෝධාරාමයට පැමිණි අවස්ථවෙහි දණ්ඩපාණි සමග ඇති වූ සාකච්ඡාව පිළිබඳ භික්ෂූන් වහන්සේලා හමුවෙහි ප්‍රකාශ කර සිටියහ. එවිට එක්තරා භික්ෂුවක් 'භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ කෙසේ නම් දෙවියන් මරුන් බඹුන් සහිත ලෝකයෙහි කෙසේ නම් ලොව කිසිවකු සමග වාදවිවාද නොකොට කාමයෙන් වෙන් ව විචිකිච්ඡා දුරුකොට පහකළ තෘෂ්ණා සහිතව බැහැර කළ පව් ඇතිව කෙලෙස් දුරුකොට සිටිත්ද'යි විමසා සිටියේ ය.

එවිට බුදුරදුන්ගේ පිළිතුර වූයේ 'මහණ, යම්සේ තෘෂ්ණා දෘෂ්ටි ප්‍රපංච සහිත සංඥාවෝ පුරුෂයා සහගත කොට පවතී ද? එබඳු ස්වභාවයක් මා තුළ නොපවතී නම් එවිට මා තුළ රාග, ද්වේෂ, දෘෂ්ටි, විචිකිච්ඡා, මාන, භවරාග, අවිජ්ජා කෙළවර කොට පවතී. එවිට කලහ, විවාද, දඩුගැනීම්, බොරුකීම්, කේලාම්කීම් ආදි ලාමක අකුසල ධර්ම නිරුද්ධව පවතී' යනුවෙනි.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ මෙම කෙටි ධර්ම විස්තරය පිළිබඳ ව තවදුරටත් කරුණු දැනගනු කැමැති මහාකච්චාන මහරහතන් වහන්සේ වෙතට වැඩම කළහ. මහාකච්චාන මහරහතන් වහන්සේ යනු එකල බුදුරදුන් දේශනා කළ කෙටි ධර්ම කරුණු සවිස්තරාත්මකව දේශනා කිරීමෙහි ලා ප්‍රසිද්ධියක් මෙන් ම තනතුරක් ද ලැබ සිටි භික්ෂූන් වහන්සේ නමකි. උන්වහන්සේ වෙත වැඩම කළ එම භික්ෂූන් වහන්සේලා බුදුරදුන් සමග ඇති වූ සාකච්ඡාවත් භාග්‍යවතුන් වහන්සේ ප්‍රපංච සම්බන්ධව දේශනා කළ කරුණුත් මහාකච්චාන මහරහතන් වහන්සේට සඳහන් කොට එය තවදුරටත් සවිස්තරාත්මකව දේශනා කරන මෙන් ඉල්ලා සිටියහ. මෙහි දී මහාකච්චාන මහරහතන් වහන්සේගේ අදහස වූයේ කිසියම් වෘක්ෂයක හරය සොයන තැනැත්තෙක් එම ගසෙහි මුල කඳ ඉක්ම අතු කොළ අතරෙහි හරය සොයන්නාක් මෙන් බුදුරදුන් හමුවූ කල්හි උන්වහන්සේ ඉක්ම තමන් වෙත පැමිණ මෙසේ ප්‍රශ්න කරන්නේ කිම ද? යනුවෙනි. ඒ භාග්‍යවත් වහන්සේ දත යුත්ත දනී. දැක්ක යුත්ත දනී. උන්වහන්සේ චක්ෂුභූත ය, ඥානභූත ය, ධර්මභූත ය, බ්‍රහ්මභූත ය. උන්වහන්සේ අමෘතදායක ය, ධර්මස්වාමී ය, තථාගත යැ, උන්වහන්සේ වෙතින් ම මෙහි අර්ථය විමසා උන්වහන්සේ දෙසන අර්ථය ම

දරා ගන්නේ නම් වඩාත් මැනැවි යනුවෙනි. එවිට එම භික්ෂූන් වහන්සේලා ප්‍රකාශ කර සිටියේ භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන අර්ථය ද අපි දරන්නෙමු. එසේ වුව ද සැකෙවින් දේශනා කරන දේ සවිස්තරාත්මක දේශනා කිරීමෙහි ලා ඔබ වහන්සේ සමර්ථයෙකි. එමනිසා මෙහි අර්ථ විස්තරය දේශනා කරන ලෙස ආරාධනා කර සිටියහ.

ඉන්පසු මහාකච්චාන මහරහතන් වහන්සේ ***'එසේ නම් ඇවැත්නි, මැනැවින් අසා දරා ගන්න' යනුවෙන් ආරාධනා කොට මෙහි අර්ථය විස්තර කළහ. ඇවැත්නි, 'ප්‍රපංච සහගත සංඥාවෝ පුරුෂයා තුළ ක්‍රියාත්මක (පුරුෂා මැඩගෙන සිටීයේ) වේ ද, මෙහි ලා සතුටු විය යුත්තක් නැත් ද කිවයුත්තක් බැසගැනීමක් නැත් ද, මෙය ම රාග, ද්වේෂ, දෘෂ්ටි, විචිකිච්ඡා, මාන, භවරාග, අවිජ්ජා යන අකුසලයන්ගේ කෙළවර ය. එවිට දඬුගැනීම්, කලහකිරීම්, බොරුකීම්, කේලාම්කීම්, එරුෂවචනකීම් ආදී ලාමක අකුසල නිරුද්ධ වේ ද'*** යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ යමක් දේශනා කළාහු ද, එය මම විස්තර වශයෙන් මෙසේ දේශනා කරමි' යනුවෙන් විස්තර කළහ.

ඇවැත්නි, ඇසත් රූපත් නිසා චක්ඛු විඤ්ඤාණය උපදී.

මේ තුනෙහි එක් වීමෙන් ස්පර්ශය හටගනී.

ස්පර්ශය නිසා වේදනා හටගනී.

යමක් විඳී ද එය හඳුනා ගනී.

යමක් හඳුනා ගනී ද එය විතර්කනය කෙරේ.

යමක් විතර්කනය කෙරේ ද එය ප්‍රපංචයට (තෘෂ්ණා, දෘෂ්ටි, මාන බවට) පමුණුවයි.

යමක් ප්‍රපංචනය කෙරේ ද එය නිදාන කොට ප්‍රපංච සංඥාවෝ අතීත, අනාගත, වර්තමාන ඇසින් දතයුතු වූ රූපයන්හි ලා පුරුෂයා මැඩගෙන (සිරගතකොට ගෙන) සිටිති. කණ, නාසය, දිව, ශරීරය, මනස යන සෙසු ඉන්ද්‍රිය පිළිබඳව ද මේ අයුරින් ම ප්‍රපංච සංඥා විසින් පුද්ගලයා සිරගත කොට ගනු ලබයි' යනුවෙනි.

මේ අනුව ඇස්, කන්, නාසාදි ඉන්ද්‍රියවලට රූප, ශබ්ද, ගන්ධාදි අරමුණු එකතු වී ඊට මනස ද සම්බන්ධ වූ විට තෘෂ්ණා, දෘෂ්ටි, මාන ආදි අකුසල දහම් සිතෙහි ජනිත වන ආකාරයත් එමගින් රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාන යන ස්කන්ධ පංචකය හට ගෙන සත්ත්වයා දුකෙහි ගිල්වා සසරෙහි තවදුරටත් රැගෙන යන ආකාරයත් විස්තර කොට තිබේ.

එමෙන් ම ඇස නැති කල්හි රූපය නැති කල්හි චක්ඛු විඤ්ඤාණය ආදි සෙසු කරුණු හට නොගෙන කෙලෙස් හට නොගන්නාවූ ආකාරය ද විස්තර වේ. කණ, නාසය ආදි සෙසු ඉන්ද්‍රිය හා ශබ්ද, ගන්ධාදි අරමුණු පිළිබඳව ද විස්තර කර තිබේ. එමගින් ප්‍රපංචයන්ට පුරුෂයාව මැඩ ගැනීමට නොහැකි වන ආකාරයත් එමගින් රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාන යන උපාදානස්කන්ධ පංචකය හට නොගෙන සත්ත්වයා දුකින් මිදී සසරින් එතෙර වන ආකාරයත් විස්තර කොට තිබේ.

මහාකච්චාන මහරහතන් වහන්සේ තමන් වහන්සේගේ මේ විස්තරය භික්ෂූන් වහන්සේලා හමුවෙහි සඳහන් කොට තවදුරටත් මේ කරුණ ගැන බුදුරජාණන් වහන්සේ වෙතින් අසා දැන ගන්නා ලෙසත් උන් වහන්සේ දේශනා කරන ආකාරයෙන් දරා ගන්නා ලෙසත් භික්ෂූන් වහන්සේලාට සඳහන් කළහ. එවිට එම භික්ෂූන් වහන්සේලා මහාකච්චාන මහරහතන් වහන්සේගේ විස්තර වර්ණනාවට සතුටු වී උන්වහන්සේට ප්‍රශංසා කොට එතැනින් නික්ම ගියහ. ඉන්පසු නැවත බුදුරජාණන් වහන්සේ වෙත ගිය එම භික්ෂූන් වහන්සේලා මහාකච්චාන මහරහතන් වහන්සේ වෙතින් අසා දැන ගත් දේශනාව බුදුරදුන් වෙත ප්‍රකාශ කර සිටියහ. බුදුරදුන් එහිදී මහාකච්චාන මහරහතන් වහන්සේ ප්‍රඥාවන්ත බව පිළිබඳව ප්‍රශංසා කොට තමන් වහන්සේ එය විස්තර කළ ද දේශනා කරන්නේ ඒ ආකාරයෙන් ම බවත් එම නිසා මහාකච්චායන මහරහතන් වහන්සේ විස්තර කළ අයුරින් එය දරා ගන්නා ලෙසත් ප්‍රකාශ කර සිටියහ.